# අකිතකත ෂි මිට්සුයනොසතො වව්චර් ( Akitakata-shi Mitsuyanosato Voucher ) සම්බන්ධවයි

අකිතකත-ෂි (Akitakata-shi) නගරයේ කොරෝනා ප්‍රචලිත වීමත් සමඟ නගරයේ ආර්ථික තත්වය නගා සිටුවීම වෙනුවෙන් සිදුකරන වව්චර් විකිණිම සම්බන්ධවයි.

◆ වව්චර් පිළිබඳ විස්තර

- වටිනාකම ¥14,000ක වව්චර් අඩංගු එක් පොතක් ¥10,000 කට දෙනු ලබයි.
- එක පොතක ¥1,000×10 සහ ¥500×8 තිබෙනවා.
- වව්චර් පොත් 40,000ක් විකිණිමට නියමිත අතර එය විකිණිමෙන් පසු නැවත නිකුත් කරන්නේ නැත.

◆ වව්චර් ගන්නේ කොහොම ද

- සතියේ දිනවල උදෑසන 9 සිට සවස 5 දක්වා නගරයේ තැපැල් කන්තෝරුවලින් මිලට ගන්න පුළුවන්.
- සති දෙකකට වරක් ඉරිදා දිනවල උදෑසන 10 සිට සවස 3 දක්වා 'ක්‍රිස්ටල් ආපෝ' (Akitakatashi culture center) පළවෙනි මහලෙන් මිලට ගන්න පුළුවන්.
- අකිතකත ෂි නගරයේ පදිංචි කරුවන්ට පමණයි මිලට ගන්න පුළුවන්.
- මිලට ගන්නා විට අනන්‍යතාවය සොයා බලන බැවින් විදේශ ගමන් බලපත්‍රය හෝ නේවාසික කාඩ්පත හෝ හඳුනාගැනීම සඳහා වෙනත් ලේඛනයන් රැගෙන එන්න.
- 2020 සැප්තැම්බර් 01 වෙනිදා සිට 2020 සැප්තැම්බර් 30 වෙනිදා දක්වා මිලට ගන්න අයට
  - එක් අයෙක්ට එක් පොතක් පමණක් මිලට ගන්න පුළුවන්.
  - මිලට ගන්නා විට මේ සමඟ ඇති 【ඉල්ලුම් පත්‍රය 1】 පුරවා රැගෙන ආ යුතුයි.
  - 【ඉල්ලුම් පත්‍රය 1】 නම සඳහන් කෙනා හෝ එම පවුලේ කෙනෙක් ට මිලට ගන්න පුළුවන්.
  - 【ඉල්ලුම් පත්‍රය 1】 නම සඳහන් කෙනා හෝ එම පවුලේ කෙනෙක් නොව වෙනත් කෙනෙක් මිලට ගන්නවා නම් මේ සමඟ ඇති පැවරීමේ ලියවිල්ලත් රැගෙන ආයුතුයි.
- 2020 ඔක්තොම්බර් 01 වෙනිදා සිට 2020 දෙසැම්බර් 25 වෙනිදා දක්වා මිලට ගන්න අයට
  - එක් අයෙකුට එක් දිනකට පොත් 10 දක්වා මිලට ගන්න පුළුවන්.
  - එම කාලයේදී මිලට ගන්න අය මේ සමඟ ඇති 【ඉල්ලුම් පත්‍රය 2】 රැගෙන ආ යුතුයි.
  - මේ සමඟ ඇති【ඉල්ලුම් පත්‍රය 2】තැපැල් කන්තෝරුවෙන් ගන්න හෝ Akitakatashi Homepage එකෙන් Download කරගන්නත් පුළුවන්.

◆ වව්චර් පාවිච්චි කරන්නේ කොහොම ද

- 2020 සැප්තැම්බර් 01 වෙනිදා සිට 2021 පෙබරවාරි 28 වෙනිදා දක්වා පාවිච්චි කරන්න පුළුවන්.
- අකිතකත ෂි නගරයේ වෙළඳසැල් වල අපේ දැන්වීම් පෝස්ටර් තිබෙනවා.
- වව්චර් පාවිච්චි කිරීමේ දි ඉතුරු මුදල් ලබා ගත නොහැක.
- වව්චර් පාවිච්චි කළ හැකි වෙළඳ සැල් නාම ලේඛණය මේ සමඟ ඇත. (අළුතින් වෙළඳසැල් ඇතුලත් විය හැකි බැවින් Homepage එකෙන් බලා ගන්න පුළුවන්.)
- ¥500 වව්චර් පාවිච්චි කරන්න බැරි ස්ථාන තිබෙනවා. ඒ පිළිබඳ මේ සමඟ ඇති නාම ලේඛණයෙන් හා Homepage එකෙන් හා වෙළඳ සැල් වලින් දැනුවත් කරලා තියෙනවා.
- ඒ වගේම සමහර බඩු සඳහාත් පාවිච්චි කරන්න බැරි අවස්ථා තිබෙනවා.
  (උදා: දුම්වැටි සඳහා, බදු ගෙවීම් සඳහා ,E-money,Prepaid Card, වෙනත් වව්චර් මිලට ගැනීම සඳහා මුදල් වෙනුවට මාරු කිරීම ආදිය කළ නොහැක.)